

# ගේය කාව්‍යය වචන වාත්තු ශිල්පයක් නොවේ.
# රවි සිරිවර්ධනගේ "මිලේනියම් පෙම්වතුන්" පෙන්වා දෙන යථාර්ථය







"එතකොට හෙට ඔබ නෑ.. ඔබ ඉන්නෙ අද විතරයි.. අද දවස හමාර වුණාම හෙට දවස.. අදත් හෙටත් දෙකම එකයි... අද අපි දෙන්න ඉන්නවා.. හෙට මම විතරයි.. හෙටත් අනිද්දටත් කවදටත් මම විතරයි.. මොකක්ද වෙනස.. අද වගේම හෙටත් කවුරුත් නැගිටිනවා.. කනව බොනවා.. වැඩට යනවා.. කතා බහ කරනවා.. මාත් මේ ඔක්කොම කරනවා.. ඒත් මම විතරයි.. ඔබ නෑ.." දෙවෙන්දොරා සං. - මළවුන්ගේ අවුරුදු දා"

මහැදුරු සරච්චන්ද්‍රයන් විරහ වේදනාව වචන වලට නංවපු -මළවුන්ගේ අවුරුදු දා" නවකතාව මට නැවත සිහිපත් වෙනව. මේ හැඟිම් අපට දැනෙන අපේ හද රිදවන ආකාරයට නැවත ප්‍රතිනිර්මාණය කරන්න පුලුවන් කාටද? මගේ මේ පැනයට නිසි පිළිතුරක් පසුගියදා මට ලැබුණා.

නොරිකෝ සං නිදියන්න
හොඳටම රෑ වෙලා
මට පාලු නෑ මේ හතර රියනට
ඔබේ ආදරේ සුදු ලිලී මල් පිපිලා
ඔබට බෑ නවතින්න මා ළඟ
යා යුතුය හෙට ජීවිතය සොයලා
කෝපි හල් මග බලාගෙන ඇති
යන්න ඒ වෙත
මගේ මතකය අතීතෙට පවරා

මේ ගේය පද රචනය මගේ සිත එක මොහොතින් කළඹන්න සමත් වුණා. සුර්ෂ් මාලියද්ද ගේ සංගීතයෙන් අමල් පෙරේරා ගේ අපූරු ගායනයෙන් යුත් මේ ගීය ලිව්වෙ රවි සිරිවර්ධන.

පද්‍ය කාව්‍යය යනු භාවයන් හා බුද්ධිය අමතන කලාවක්. ගීතයක් පළමුව ඇහෙන්නේ අපගේ දෙසවනටයි. එහෙයින් ගේය කාව්‍යය හෙවත් ගී පද මාලාව ප්‍රථමයෙන් ශ්‍රවන ඉන්ද්‍රියන් ඔස්සේ රසිකයා වෙත ළං වෙයි. ඉන් පසු ඔහුගේ භාවයන් හා බුද්ධිය පුබුදුවාලයි. මෙසේ භාවයන් උද්දීපනය කිරීමට සෑම ගේය පදයකටම නොහැකිය. එසේ වීමට නම් එහි අපූර්වත්වයක් තිබිය යුතුය. මේ අපූර්වත්වය ළඟා කර ගැනීමට ගේය පද රචකයා ගේ පරිකල්පන ශක්තිය ඉතාමත් වැදගත් අංගයක් වන්නේ ය. එමෙන්ම ශබ්ද රසය මෙන්ම ඉතා අර්ථාන්විත භාෂාවකින් රචනා වී තිබිය යුතු ය. මේ සියලු දේ කැටි කොට ගත් අපූරු සංගත තැටියක් අසන්නට අවස්ථාවක් මට මෑකතදී ලැබුණි. ඒ රවි සිරිවර්ධන නමැති පරිනත තරුණ ගේය කාව්‍ය රචකයා ගේ -මිලේනියම් ප්‍රේමය" සංගත තැටියයි.

එකකට එකක් වෙනස් අයුරින් රචනා කර ඇති මෙම ගේය පද ඇතුළත් සංගත තැටිය ඇසීමෙන් ඔබටද එය පසක් වනු ඇත.

නිමක් නැති පෙමක් ලොව
තිබේ නම් පිදුම් ලද
ඒ පෙමට නම තමයි අම්මා
ලොවම එරෙහිව නැගෙනා
පැයක හදවත නිවන
මහැරු ඔසු පැන් වඩන පෙම්මා
ඒ පෙමට නම තමයි අම්මා

මව් ගුණ ගී අප කොපමණ අසා තිබුණත් මේ ගේය පදයේ ඇති අරුත් බර බව මේ පද කියවන ඔබටද මැනවින් වැටහෙනු ඇත. ජීවිතයේ නැගීම් වැටීම් සියල්ල හමුවේ සියලු දෙනා අප හැර යද්දී අබමල් රේණුවක හෝ වෙනසක් ප්‍රේමයකින් අපේ හිස පිරිමදින්නී අම්මා නොවන්නේ ද? ඇගේ පෙම හදවත නිවන ඔසු පැනක්ම නොවන්නේ ද? අම්මාගේ පෙම ගැන කියන්නට මෙයටත් වඩා සුදුසු වදන් කොතනින් සොයා ගන්නද?

සඳ ගිරි පව්ව උසයි
කිඳුරා හරිම වසයි
මං ගෙදර එන්න ආවා අම්මේ
දොර අරින්න නුඹ විතරයි ඉන්නේ

රත්තරන් කියා කඩු තුඩ
මං ඇනගත්තෙ පපුවට
නුඹ එපා කියද්දිමයි අම්මේ
ඒ කුල ගෙය දැන් ගිණි ගෙය වැන්නේ

සල්පිලෙන් අරන් නටවන
කිඳුරියන් රඟන සඳ ගිර
මේ අරුමෝසම් හුරු නෑ අම්මේ
නිය පහුරු වැදුණු හිත බලපන්නේ

උපමා රූපක භාවිතය පිළිබඳ කදිම උදාහරණයක් දෙන රවි ගේ මේ නිර්මාණය කළකින් මා කියවූ අපූරු පද රචනයකි. යව්වන ප්‍රේමයේ මායාවෙන් අන්ධව දෙමාපියන්ට අකීකරුව සරණ ගොස් නැවත ගෙදර ආ දියණියකගේ කතාව ඉතා සාර්ථක ලෙස ව්‍යාංගයෙන් කියන්නට රවි තෝරාගෙන ඇති සඳ කිඳුරු ජාතකයේ චරිත අපූරුය. (දෙවෙනි අන්තරා කොටසේ එන -ඒ කුල ගෙය දැන් ගිණි ගෙය වැන්නේ" පදය රවි නොලීවා නම් මැනැවැයි මට සිතෙයි. සියල්ල ව්‍යංගයෙන් අපූරුවට කියාගෙන යන අතර තුර එය රසිකයාට තේරුම් ගන්නට ඉඩ නොදී රචකයා මැදිහත්ව අදහස සෘජුව නොකීවා නම් අපූරුය. කෙසේ වුවද මෙයින් ගීයේ නිර්මාණාත්මක බවට හානියක් සිදු නොවේ යයි මම සිතමි)

දුරකතන මුහුණ මත
ඇගෙ රුසිරු වත
නුඹෙ අතේ වෙලී ඇවිදියි
නද දෙතැයි සිතා
පෙම්බර ඇමතුම්
දුරකතන මුහුණු විමසයි

පන්හිඳ කුමටද
මුතු ටයිප් අකුරු ලියැවෙයි
මුද්දර කුමටද
හී වෙසින් හසුන් ඉගිලෙයි
මිලේනියම් පෙම්වතුන්
මිල වැඩියි පෙම් පැතුම්

කාලය වෙනස් වෙමින් යයි. එදවස අප පෙම් කළ යුගය නිමා වී නවීන තාක්ෂණයෙන් පෙම් කරන යුගයට අපි එළැඹ සිටින්නෙමු. පෙම් පතක් ලියාගෙන එය පෙම්වතිය අතට පත් කරන්නට මගක් සොයමින් දවස් ගණන් ළතැවුණ පෙම්වතුන් සිටියේ අපේ යුගයේ ය. දැන් පෙම්පත ලියූ සැණින් පෙම්වතිය අතට පත් වන්නේ ජංගම දුරකතනය ඔස්සේය. එකම වෙනස අපේ කාලයේ අතින් ලියා යවන පෙම්පතකට වඩා මේ පෙම්පතට මිලක් වැයවීමයි. එහි මුහුණතේ ඇත්තේද ඇගේ රුවයි. කිසිවකුගේ ඇස නොගැටුණ මේ අපූරු අදහස ගීයකට නංවන්නට රවි සමත් වෙයි.

මෙම සංගත තැටියේ අපූර්වත්වයට හේතු පාදක වන තවත් කාරණාවක් වන්නේ මේ ගීතාවලියට තනු නිර්මාණය කළ රෝහණ වීරසිංහ රෝහණ ධර්මකීර්ති කරුණාරත්න විජේවර්ධන සුරේෂ් මාලියද්ද වැනි සංගීතවේදීන් දක්වා ඇති ප්‍රතිභාවයි. මේ ගී අතරින් අප සමග ජීවත්වන තරුණ සංගීතවේදීන් දෙදෙනෙකු වන තරුපති මුණසිංහත් කළිඳු වීරසිංහත් තනු නිර්මාණ වලින් පෙන්වා ඇති ප්‍රතිභාව සුවිශේෂී වෙයි.

මෙවැනි ගීත රාශියක් එක් කළ "මිලේනියම් පෙම්වතුන්" සංගත තැටියට ඔබද සවන් දිය යුතු යයි මම සිතමි. ගීතයක් රස විඳීමේදී ඒ ගීතයෙන් මතු කෙරෙන භාවයනට ඔබේ හදවතේ ඉඩක් දිය යුතුය. නියම රස වින්දනය ඇත්තේ එතැන ය. අදඅ පට ඇසෙන බොහෝ ගීත වල ඇත්තේ අපේ හද කම්පනයට පත් කරවන හැඟිම් නොව හුදු වචන හරඹ පමණකි.

රවි ගේ "වසත් කාලය" ගේය පද රචනා සංග්‍රහටය මහින්ද චන්ද්‍රසේකර විසින් ලියන ලද මේ පසු වදන මේ ලිපිය නිමා කරන්නට කදිමට ගැලපෙයි.

"ගේය කාව්‍යය වූ කලී වචන වාත්තු ශිල්පයක් නොව අර්ථ මූලික රස නිශ්පත්තිය ප්‍රමුඛ කර ගත් කලා මාධ්‍යයක් ලෙස දෙපයින් සිට වූ ශ්‍රී චන්ද්‍රරත්න මානවිසංහ මඩවල එස් රත්නායක මහගම සේකර ආදී පුරෝගාමී ගේය කාව්‍ය රචක පෙරහැරේ අගට එක්වෙමින් රවි සිරිවර්ධන නම් වූ තරුණ කවියා ගේය කායන රචකයා සෙමින් තිරසාර ලෙද පියවර ඔසවා පැමිණෙන අයුරු සොම්නසින් බලා සිටීමේ භග්‍යය ගෙවුණු දශකයකට අධික කාලය තුළ අපට හිමි විය. රවි සිරිවර්ධන නම් පරිනත ගේය කාව්‍ය රචකයාගේ ගමන් මග දෙස අද මම සෙනෙහසින් බලා සිටිමි" මහින්ද චන්ද්‍රසේකර.





ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ විද්‍යාර්ථීන්ගේ සංගමය විසින් සංවිධානය කරනු ලබන සිංහල අවුරුදු උත්සවය මෙවර ද

**2011 අප්‍රේල් මස 16**

වන සෙනසුරාදා ප.ව. 2.00 සිට 7.30 දක්වා අංක **649 Ferntree Gully Road, Glen Waverley** හි බ්‍රැන්ඩන් පාක් ප්‍රජා ශාලාවේ දී පැවැත්වේ.

මෙල්වේ යොමුව **71C8**



පාරම්පරික ජන ක්‍රීඩා හා විනෝදාංශ රැසකින් සමන්විත මෙම අවස්ථාවට සහභාගි වන ලෙස සියලුම ජපුර සාමාජිකයින් හට මෙයින් ආරාධනා කෙරේ.

ජපුර සාමාජිකයින් විසින් සපයනු ලබන සාම්ප්‍රදායික අවුරුදු කෑම මේසය ප.ව. 2.30 ට ආරම්භ වීමට නියමිත ය.

වැඩි විස්තර www.japuraalumni.com වෙබ් අඩවියෙන් හෝ කමල් 0421 993 190, අමල් 0412 775 889, අනුර 0431 112 923, නලින් 0430 934 455, රේණුකා 0423 422 819, රෝහිත 0423 731 659 යන දුරකථන අංක ඔස්සේ ලබා ගත හැක.

ආප්ප, කොත්තු රොටි ආදී අමතර ආහාර පහසු මිලට ලබා ගැනීමට පහසුකම් ද මෙදින සලසා ඇත.